LTS LA TROBE TAXATION SERVICES

*Your friendly tax accountants*




***La Trobe Taxation Services is in operation since 2001 and provide taxation services to businesses and individuals. Our areas of specialisation are individual tax returns, business tax returns, investment properties, GST, BAS, IAS, PAYG and registering of ABR. Whenever you have tax related issues we are here to assist you as possible as we could. Our fees are very reasonable and competitive.***

*La Trobe Taxation Services*
*Registered Tax Agent*
*(ABN 67 251 931 300)*

**CONTACT**
**Bundoora:**
**Mala: - 0401000421 or 03-94708241**
**Cranbourne:**
**Janaka:- 0403728635 or 03-87868033**

**Email:** *latrobetax@yahoo.com.au*

**www.latrobetax.com.au**

## එමලි සහ අහස

නිර්වර්ණ
උපේක්ෂා සේනානායක
COLOURLESS

දරුවන්ගේ රසඥතාව උසස් තත්ත්වයකින් පවත්වාගෙන යාමට වෙර දරන දෙමව්පියන් මෙල්බර්න් නගරය තුල විරල නැත. වර්තමාන ශ්‍රී ලාංකීය සමාජය දරුවන්ගේ රසවින්දනය දියුණු කිරීම පිළිබඳව සිටින්නේ කොතැනදැයි ඉඳහිටක මවිරටට ගිය විට දැසින්ම දැක ගත හැකිය. මුහුණු පොත සහ අන්තර්ජාලය අවභාවිතාව හේතුවෙන් අපමණ ගැටලු වලට මැදිවූ දරුවන් ලාංකීය සමාජය තුළ මට කොතෙකුත් හමුවී තිබේ.

ඔස්ට්‍රේලියානු ප්‍රාථමික පාසල් අධ්‍යාපන ක්‍රමය තුල පවතින නිවසේදී කියැවීම සඳහා පොතක් දිනපතා එවීමේ ක්‍රමවේදය මා යටකී රසඥතාව ඉහළ නැංවීමේ උත්සාහයට ප්‍රබල සහයෝගයක් ලබා දේ. දරුවන් තුල ආකල්පමය වෙනසක් ඇතිකිරීමට උත්තේජනයක් ලබාදෙන අන්තර්ගතයක් ඒ පොත් වල තිබෙන බව මම අත්දැකීමෙන් දනිමි.

වරක් මගේ මිතුරිය දිලිනි ඇගේ එකම පුතු කෙනී සහ ඇය අතර වූ එක්තරා සංවාදයක් මට විස්තර කළාය. එක් පාසල් දවසක ඇය කෙනීව පාසලට ඇරලවීමට යන විට ඔවුන්ගේ සාමාන්‍ය උදෑසන කතාබහ අතර තුර කුඩා කෙනී අහසට ඇඟිල්ල දිගු කර "අද එමලි අහසේ ඉන්නවා අම්මේ" යැයි එක්වරම සඳහන් කළේය.



උදා ඉරු නැගෙමින් පවතින අහස ලාරෝස පැහැයින් කාන්තිමත්ව තිබෙනු දුටු මගේ මිතුරිය "ඇයි පුතා එමලි අහසේ ඉන්නවා කිව්වෙ" යැයි පුතුගෙන් අසා තිබේ.

"එමලි හිනාවෙන කොට ඔය වගේ" කෙනී දුන් පිළිතුරට දිලිනි ගේ සිත කෙතරම් ආනන්දයකින් පිරී ගියාද යත් මෝටර් රිය මාවත අද්දර සීරුවට නතර කර ඇවිත් ඇය තම පුතු වැළඳ ගත්තාය. කෙනී තම පාසල් මිතුරියගේ සිනාසෙන රෝස කම්මුල් පරිසරය සමඟ සසඳා විඳගැනීමට තරම් වැඩී සිටීම මොනතරම් සුන්දරදැයි මට සිතුණි. ඔහු සිය කවීත්වයේ මූලික අඩියරවල් පසු කරමින් සිටින බව මම පසක් කළෙමි. සිය නිවසේදී කියවීමට ලැබෙන පොත් කියවා ඔහු වෙනස් අන්දමක අවසානයක් පොතට ලබාදීමට දරන උත්සාහය තුළ සම්ප්‍රදායික කථා කලාවෙන් වියුක්තව වෙනස් මගක යන බව මම දකිමි.

මෙල්බර්න් නගරය තුළ මෙබඳු දරුවන් මට නිතර හමුවේ. "හෝ ගානා පොකුණෝ" චිත්‍රපටය නැරඹීමට නොගිය දරුවකු මට හමුවූයේ කලාතුරකිනි. එහි ඇතුලත් ගීතයකට ඉදිරිපත් කළ නර්තනයක් මෑතකදී මම හැම්ප්ටන් පාර්ක් සිංහල භාෂා පාසලේ වාර්ෂික විවිධ ප්‍රසංගයේදී දුටුවෙමි. විශේෂත්වය වූයේ බහුතරයක් දරුවන් නර්තනයේ යෙදෙන අතර එම ගීතය ගායනා කරනු දැකීමය. ඔවුන් ගීතයේ අර්ථය හොඳින් දැන සිටි බව ඒ රංගනය දුටු අයෙකුට අවබෝධ වේ .එහි ගෞරවය එම ගුරුතුමියට නිසැකවම හිමි විය යුතුය. ගුරුවරුන් සහ දෙමව්පියන්ගේ සාමූහික ප්‍රයත්නයෙන් වඩා යහපත් දරු පරපුරක් මෙල්බර්න් නගරය තුළ බිහිවෙමින් සිටින බව දැකීම අපගේ අස්වැසිල්ලට හේතුවක් නොවන්නේද?

විදුලි වේගයෙන්...



MNM
ELECTRICAL & DATA

**New Installation**
**Electrical Repairs**
**Switchboard upgrades**
**LED Down lights**
**Celiing fans**
**Phone & Data Points**
**camera systems**
**Alarm Systems**
**TV Brackets & Antenna Installations**

**Maheel Munidasa**
Registered Electrical Contractor
**Reg No 21920**

**M - 0430 293 260**

Commercial / Domestic
Any type of Repairs and Installations

JAPANESE
By a qualified experienced teacher with proven results

**PREP to VCE**

- **Rapid Learning Strategies**
- **Special Attention for School Assessment Course work (SAC) according to VCAA Study Design.**
- **Exam Revision and Preparation for VCE written and oral exam.**

12+ Years' Experience in Teaching
Postgraduate Diploma of Education (Monash University) , B.A. (Hon)
Trained in Japan through a Japanese government scholarship
to teach Japanese language.

**Contact Number: 0425 396 975**